# තිරසාර සංවර්ධනයට පාරිසරික බලපෑම් තක්සේරුව


## සාරාංශය

අර්ථ ක්‍රමයක් තිරසාර සංවර්ධනය කරා යන ගමනේදී එකී ක්‍රියාවලියේ පදනම වශයෙන් පරිසරය ආරක්ෂාකර ගැනීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් විවාදයක් නොමැත. යෝජිත සංවර්ධන ව්‍යාපෘති පරිසරයට හිතකර හා තිරසාර වන්නේදැයි හොඳින් පරීක්ෂාකර බැලීම වටී. පාරිසරික බලපෑම් තක්සේරුකරණයේ අරමුණ වන්නේ යෝජිත ව්‍යාපෘති සම්බන්ධයෙන් වඩාත් පාරිසරික වශයෙන් නිවැරිදි තීරණ ගැනීමට හැකිවන පරිදි එහි විනිවිධභාවය සත්‍ය වශයෙන්ම පෙන්වාදීමයි. පාරිසරික බලපෑම් තේරුම් ගැනීම පරිසරය සුරැකීම පුණර්ජීවනය කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් සම්පාදකයින් හා මහජනතාව තුළ නිවැරදි දර්ශනයක් පැවැතිය යුතුය. සංවර්ධන ක්‍රියාවලියේදී සාර්ව ආර්ථික තුලනයක් පවත්වාගෙන යෑමට නම් පරිසරය හා සංවර්ධනය අතර සමතුලිත බවක් පවත්වා ගෙන යා යුතු වේ. ආර්ථිකයක සෑම ජන කොටසකගේම සමාජ සුබසාධනය ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගෙන යෑමේදී ස්වභාවික සම්පත් වර්තමාන පරිභෝජනයෙන් ඔබ්බට සුරැකීමේ අවශ්‍යතාව මත අනාගතය පිළිබඳ පූර්ව නිගමනයන්ට එළඹිය හැකිය. පාරසරික වශයෙන් වඩාත් තිරසාර සංවර්ධනයක් සඳහා පාරිසරික බලපෑම් තක්සේරුකරණයේ අවශ්‍යතාව වෙත ලොව සියළු ජන කොටස්වල අවධානය යොමුවිය යුතුය.

පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සරළ හා ඍජු ක්‍රියාවලියකි. මෙමගින් සිදු කෙරෙනුයේ සංවර්ධන ක්‍රියාවලියෙන් ස්වභාවික හා සමාජීය පරිසරය කෙරෙහි ඇතිවන බලපෑම ප්‍රථමයෙන් හඳුනාගැනීමයි. එහි ඇති අහිතකර බලපෑම් ඉවත් කිරීමට හෝ අවම කිරීමට කටයුතු යෙදීමත්, හිතකර බලපෑම් උපරිම කිරීමට කටයුතු කිරීම දෙවනුව සිදු කෙරේ. පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකළ හොත්, එමගින් ප්‍රථම හා ප්‍රමුඛ ලෙස ප්‍රතිලාභ ලබන්නේ ව්‍යාපෘති යෝජකයා හා ස්වාභාවික සම්පත් භාවිත කිරීමට බලාපොරරොත්තු වන අන් ආයෝජකයන්ය. පරිසර තක්සේරු ක්‍රියාවලිය තුළින් ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති අරම්භ කිරීමට පෙර රාජ්‍ය ආයතන හා මහජනතාව යන දෙපාර්ශවයට පාරිසරික හා සමාජ ගැටලු සඳහා විසඳුම් ලබාගැනීමට ඉඩ ප්‍රස්ථා සපයා දෙනු ඇත. ඉතා සරලව පවසන්නේ නම් පාරිසරික බලපෑම් තක්සේරුව මගින් නිෂ්පාදකයන්ට තිරසාර ආයෝජනයක්ද, පාරිභෝගිකයන්ට යහපත් තිරසාර පරිසරයක්ද නිර්මාණය කෙරේ.

තිරසාර සංවර්ධන උදෙසා අර්ථක්‍රමයක් තුළ පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලියේ ඇති වැදගත්කම හා එය සිදුකළ යුතු ආකාරය පිළිබඳව මෙම ලිපිය මගින් අවදාරණය කෙරේ.

**හැඳින්වීම**

පාරසරික බලපෑම් තක්සේරුව ප්‍රථමයෙන් ලොවට හඳුන්වා දෙන ලද්දේ 1970 දශකයේ මුල් අවධියේ ඇමෙරික එක්සත් ජනපදය මගිනි (Natural Resources Diffence Council –NRDC). වර්තමානය වන විට ලොව රටවල් 90 කට ආසන්න ප්‍රමාණයක් එය පිළිගෙන තිරසාර සංවර්ධන අභිප්‍රායන් සාක්ශාත් කිරීම වස් පරිසරය හා සංවේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කෙරේ. ශ්‍රී ලංකාවට පාරිසරික බලපෑම් තක්සේරුකරණය මුළින්ම හඳුන්වා දෙන ලද්දේ 1981 අංක 57 දරණ වෙරළ සංරක්‍ෂණ ආඥා පනත (Coastal Conservation Act-1981) මගිනි. මෙකී පනතින් ආවරණය කරන ලද්දේ වෙරළ කලාපය යටතේ ඇති ව්‍යාපෘති පමණකි. එම නිසාම 1988 දී අංක 56 දරණ ජාතික පාරිසර (සංශෝධිත) පනත (National Environmental (Amendment) Act-1988) මගින් මුළු දිවයිනටම වලංගු වන පරිද්දෙන් පාරිසරික බලපෑම් තක්සේරුව හඳුන්වා දෙන ලදී.

දිවයිනේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමට නිර්මිත ව්‍යාපෘති පිළිබඳ ලේඛන ගත කිරීමක් 1993 ජුනි මස 24 දින අංක 722/22 දරණ රජයේ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇත. 1995 පෙබරවාරි 23 දින අංක 859/14 දරණ ගැසට් නිවේදනය මගින් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන මොනවාද යන්න වර්ග කර ඇත. එහෙත් කිසියම් අයෙකුට හෝ ආයතනයකට මෙකී කටයුතු පිළිබඳ මූලික තොරතුරු අවශ්‍ය වන්නේ නම් මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශයෙන් එකී අවශ්‍යතාව ඉටුකර ගත හැකිය. රාජ්‍ය ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කර ඇති ආකාරයට කිසියම් ව්‍යාපෘතියක් සඳහා පරිසරික බලපෑම් තක්සේරුවක් කිරීමේදී එමගින් පරිසරය වෙත කෙරෙන බලපෑම් ප්‍රමාණය මත ඇගයීම් ක්‍රම දෙකක් ඇති අතර ඉන් එකක් තෝරාගත හැකිය.

1. මූලික බලපෑම් තක්සේරු වාර්තාව (Initial Environmental Impact-IEE)
11. පරිසර බලපෑම් තක්සේරු වාර්තාව (Environmental Impact Assessment-EIA)

ක්‍රියාත්මක කිරීමට නිර්මිත ව්‍යාපෘති මගින් පරිසරය වෙත සිදුවිය හැකි බලපෑම සුළු අගයක් ගන්නේ නම්, එකී ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාථමික පරිසර බලපෑම් වාර්තාවක් සැකසීම පමණක් ප්‍රමාණවත් වනු ඇත. එහෙත් යෝජිත ව්‍යාපෘතිය මගින් පරිසරයට විශාල වශයෙන් බලපෑමක් ඇති කෙරෙන්නේ නම්, ඒ සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් සැකසීම අත්‍යවශ්‍ය වන්නෙකි.

කිසියම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, ඊට පෙර මූලික වශයෙන් එකී ව්‍යාපෘතිය පාරිසරික බලපෑම් තක්සේරුවලට අදාළව ලැයිස්තු ගත වන්නේද යන්න පිරික්සිය යුතුය. ඉන් අනතුරුව එකී ව්‍යාපෘතිය අනුමත කරවා ගැනීමේ (Project approving agency) අදාළ රාජ්‍ය ආයතනය හෝ ආයතන මොනවාද යන්න හඳුනාගත යුතු වේ. නිදසුන් වශයෙන් මුහුදු වෙරළට

සමීපව කෙරෙන ව්‍යාපෘතියක් නම්, අදාළ රාජ්‍ය ආයතනය වන්නේ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. විශාල වනාන්තරයකට සමීප ව්‍යාපෘතියක් නම් අදාළ ව්‍යාපෘතිය අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වන්නේ පරිසර විශය භාර අමාත්‍යාංශය හෝ වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. (ස්ථානීය වශයෙන් පිහිටීම හා රාජ්‍ය හිමිකාරීත්වය මත අදාළ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙනස් වනු ඇත). ව්‍යාපෘතිය අනුමත කරවා ගැනීමට අනුයෝජිත ආයතන හෝ ආයතන වෙත යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ සියළු තොරතුරු ලබාදිය යුතු වේ. ව්‍යාපෘති යෝජකයා විසින් තෝරා ගන්නා ලද ක්ෂේත්‍රයේ විශේෂඥයින් මගින් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් සකස් කළ යුතුය.

**පාරිසරික බලපෑම් තක්සේරුව (Environmental Impact Assessment)**

පාරිසරික බලපෑම් තක්සේරුව යනු ආර්ථිකයක සංවර්ධන යෝජනා ක්‍රම නිසා ආතිවන පාරිසරික බලපෑම් හඳුනාගැනීම හා පුරෝකථනය කිරීමත් පරිසරයට සිදුවිය හැකි අහිතකර බලපෑම් ඉවත්කිරීම හෝ අවමකිරීම හා හිතකර බලපෑම් උපරිම කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග යෝජනා කෙරෙන්නාවූ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විවෘත ක්‍රියාවලියකි. පාරිසරික බලපෑම් තක්සේරුවේ දර්ශනය වන්නේ පරිසරය හා සංවර්ධනය අතර පවත්නා බෙදා වෙන් කළ නොහැකි අවියෝජනීය සම්බන්ධය හඳුනාගැනීමයි. ඊට අමතරව සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ ආරම්භක අවස්ථාවේදීම පරිසර සංරක්ෂණය හා ආර්ථික සංවර්ධනය එක් අරමුණක් කරා එනම් මානව සුබසාධනය සඳහා යොමු කිරීම හා සංවර්ධනය ඒකාබද්ධ කිරීම මගින් සංවර්ධන ප්‍රයත්න වල තිරසාරභාවය හා සියළු දෙනාටම ජීවත්විය හැකි යහපත් මෙන්ම හිතකර හා ප්‍රසන්න පරිසරයක් පවත්වා ගැනීමේ ඇති හැකියාව ගොඩනැන්වීමට අවැසි මාර්ගෝපදේශකත්වය සපයාදීමයි.

පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලියේදී පරිසරය යන්න ප්‍රධාන කොටස් තුනක් යටතේ වර්ග කෙරේ.

1 භෞතික හෝ අජීවී පරිසරය (Physical Environment)
වාතය, ජලය හා භූමිය මෙයට අදාළ වේ

11 ජීවී පරිසරය (Biotic Environment)
ශාක හා සත්ව කොටස් මෙයට අයත් වනු ඇත

111 සමාජීය පරිසරය (Social Environment)
මානව සමාජය විසින් බිහිකළ සියළු දෑ, යටිතල පහසුකම්, ආර්ථික කටයුතු හා සංස්කෘතික කටයුතු වැනි දෑ මේ යටතේ සළකා බලනු ඇත.

මෙම කොටස් තුන යටතේ යම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම මගින් සිදුවිය හැකි බලපෑම් පිළිබඳ පූර්ව තක්සේරුවක් කිරීම පාරසරික බලපෑම් තක්සේරු වාර්තාව යටතේ සිදු කෙරේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවැසි ප්‍රාග්ධනය හා

වෙනත් ආධාර මෙන්ම විවිධාකාර පහසුකම් ලබාදෙන ජාත්‍යන්තර ආයතන විසින්ද පරිසරික බලපෑම් තක්සේරුකරණය අනිවාර්ය අංගයක් ලෙස සැලකේ.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කිසියම් ව්‍යාපෘති යෝජනාවක් සඳහා පාරිසරික බලපෑම් තක්සේරුවක් අවශ්‍ය වන්නේද නැද්ද යන්න 1993 ජුන් 24 දිනැති අංක 722/22 දරණ රජයේ ගැසට් නිවේදනය මගින් පෙන්වා දී ඇත. එහෙත් වයඹ පලාත් සභාව යටතේ එම බල ප්‍රදේශයට අයත් භූමියක යම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට නිර්මිත (Prescribed) වන්නේ නම් ඒ සඳහා වයඹ පලාත් පරිසරික පනත (North-Western Environmental Act) ට අනුව ක්‍රියාත්මක කළ යුතු වේ. ඊට අමතරව ව්‍යාපෘතිය ආරම්භ කෙරෙනුයේ වෙරළ කලාපයේ නම් එහි බලතල වෙරළ සංරක්ෂණ පනත යටතේ පවතී වෙරළ කලාප යනු දිවයින වටා පිහිටි මුහුදු ගොඩබිම් මායිමේ සිට මීටර් 300 ක් රට අභ්‍යන්තරයට හා සාගරය දෙසට කිලෝ මීටර 2ක් අයත්වන ප්‍රදේශයයි (කලපු හෝ ගංගා සම්බන්ධයෙන් නම් වෙරළට ලම්භකව කිලෝ මීටර 2ක් රට අභ්‍යන්තරයට ඇති ජල තීරය වෙරළ කලාපයට අයත්වේ).

**පාරිසරික බලපෑම් තක්සේරු නිර්මිත ව්‍යාපෘති**

පරිසරයට සැලකිය යුතු තරම් බලපෑමක් සිදුවිය හැකි යැයි සැළෙකෙන මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘති පමණක් නිර්මිත ව්‍යාපෘති ලැයිස්තුවට ඇතුළත් කෙරේ. මහා පරිමාන කාර්මික නිෂ්පාදන ව්‍යාපෘතිද මෙම ගණයට අයත් වේ මෙම ව්‍යාපෘති කොටස් දෙකක් යටතේ වර්ග කෙරේ.

1 ව්‍යාපෘතියේ වර්ගය හා ප්‍රමාණය පදනම් කර ගනිමින් (මෙගා වොට් 25 ට වැඩි තාප බලාගාර ව්‍යාපෘති, කාමර පහසුකම් 99 ට වැඩි හෝටල්, කිලෝ මීටර 10 ට වඩා දිග මහා මාර්ග, සිමෙන්ති හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, හෙක්ටයාර් 4 ට වඩා විශාල ජලජ ජීවී වගා කිරිමේ ව්‍යාපෘති ආදීය).

11 පිහිටීම අනුව (පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ වන ඇළ දොළ ආශ්‍රිතව පිහිටි රක්ෂිතයන්, පුරාවිද්‍යාත්මකව වෙන් කළ හැකි ප්‍රදේශ, පස සෝදා හා හැකි යැයි ප්‍රකාශිත ප්‍රදේශ යනාදිය ස්ථාණිය වශයෙන් සැළකෙන ව්‍යාපෘති මුළුමනින්ම හෝ ව්‍යාපෘතියෙන් කොටසක් පිහිටීම).

පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව විශේෂඥ උපදේශකයන් විසින් සකස් කළ යුතු වේ මෙම වාර්තව පහත දැක්වෙන කරුණු වලින් සමන්විත වූවකි.

1. යෝජිත ව්‍යාපෘතියේ විස්තර
   ව්‍යාපෘතියේ අවශ්‍යතාව අරමුණ හෝ අරමුණු යෙදවුම් සහ නිමැවුම් පිළිබඳ වියදම් ප්‍රතිලාභ ඇතුළත් තොරතුරු බාධා හා සීමාවන් මොනවාද යන්න මෙන්ම ව්‍යාපෘතියේ ශක්‍යතාව පිළිබඳ තොරතුරු ඇතුළත් විය යුතුය.

11. යෝජිත ව්‍යාපෘතිය පිහිටුවීමට අපේක්ෂිත භූමි ප්‍රදේශයේ පරිසරය
කුමන භූගෝලීය පරිසරයක් තුළ ව්‍යාපෘතිය ඉදි කෙරෙන්නේද යන්න මෙන්ම කුමන ප්‍රදේශයක් පුරා එහි බලපෑම් විසිරී පවතින්නේද යන්නත් එකී පරිසරයෙන් උරා ගන්නා හා බැහැර කෙරෙන දෑ මගින් සිදු විය හැකි පාරසරික වෙනස්වීම් ආදීය මීට ඇතුළත් වනු ඇත .

111. ව්‍යාපෘතියෙන් ඇතිවිය හැකි අහිතකර සහ හිතකර බලපෑම්
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් ඇතිවිය හැකි යැයි පුරෝකථනය කෙරෙනු ලබන හිතකර බාහිරතාවන් මොනවාද යන්න සහ අහිතකර බාහිරතාවන් මොනවාද යන්න පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් මෙමගින් කෙරෙනු ඇත .

V1. අහිතකර බලපෑම් සමනය කිරීමේ ක්‍රියාමාර්ග
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් සිදුවිය හැකි අහිතකර බලපෑම් ඉවත් කරගත හැකි ක්‍රියාමාර්ග මෙන්ම අහිතකර බලපෑම් මුළුමනින්ම ඉවත් කරගත නොහැකි වන්නේ නම් ඒවා අවම කරගත හැකි ක්‍රමෝපායන් මොනවාද යන්න සහ එමඟින් බිහිවිය හැකි ඍජු හා වක්‍ර ප්‍රතිලාභ මොනවාද යන්න පිළිබඳ පුළුල් විග්‍රහයක් මෙමගින් අපේක්ෂා කෙරේ.

V. සාදාරණ ප්‍රයෝගික විකල්ප
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පමණක් එකම අරමුණ නොකරගත් එහෙත් එමඟන් බිහිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක ගෙන දෙන බලපෑම් ඉවත් කර ගන්නා ආකාරයන් මෙන්ම යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකෙරෙන්නේ නම්, එකී අවශ්‍යතාව සපුරාගත හැකි විකල්ප ක්‍රියාමාර්ග මොනවාද යන්නත් පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කළ යුතුය.

යෝජිත ව්‍යාපෘතියක් සඳහා පාරිසරික අවසරය ලබාදිය හැකි ද යන්න තීරණය වනුයේ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව මතය. මෙම වාර්තාවට ව්‍යාපෘතියෙන් සිදුවිය හැකි හිතකර හා අහිතකර සියළුම බලපෑම් අන්තර්ගත වන සවිස්තරාත්මක විශ්ලේෂණයක් අඩංගු කළ යුතුය. එමෙන්ම මෙය හුදෙක් ව්‍යාපෘතිය කෙසේ හෝ සාදාරණීයකරණය කෙරෙන්නා වූ තත්ත්වකට නැඹුරු වූ පක්ෂග්‍රාහී ලේඛනයක් ලෙස කිසිවිටෙකත් ඉස්මතු නොවිය යුතුය. එමෙන්ම මෙය ඒක පාර්ශවීය අවශ්‍යතා ගැන පමණක් නොසලකා පොදුවේ සියළු දෙනාටම පිළිගත හැකි දිගුකාලීනව පවා සිදුවිය හැකි ප්‍රතිඵල නිවැරදිව පුරෝකථනය කෙරෙනු ලබන හා පූර්ණ විනිවිද බවකින් යුක්ත වූවක් විය යුතුය.

නිර්මිත ව්‍යාපෘතිය පිහිටුවීමට හෝ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන භූමි ප්‍රදේශ හා සම්පත් කෙරෙහි පාලන බලතල හිමි අදාළ සියලුම රාජ්‍ය ආයතන, ව්‍යාපෘතිය පිහිටුවීමට යෝජිත ස්ථානයට ආසන්න ප්‍රදේශ වල වෙසෙන ප්‍රජාව හා ඔවුන් ගේ නියෝජිතයින් හා යෝජිත ව්‍යාපෘතියේ බලපෑම් සම්බන්ධව උනන්දුවක් දක්වන වෙනත් පිරිස් හා සංවිධාන වල නියෝජිතයින් යනාදී සෑම දෙනාගේම අදහස් ලබා ගැනීම සිදුකළ යුතුය. එහි දී ව්‍යාපෘතිය පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගත හැකි වනවා සේම සත්‍ය තොරතුරු ජනතාවට ලබා දිය

හැකිය. ව්‍යාපෘතිය මගින් ප්‍රජාවට අහිතකර බලපෑම් ඇතිවන්නේ නම් ඒ පිළිබඳ ඔවුන්ගේ අදහස් විමසීමත් එවැනි බලපෑම් අවම කිරීමට හෝ වැළැක්වීමට අවශ්‍ය විකල්ප හා උපාය මාර්ග සකස් කිරීමෙහි ලා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමත් වැදගත් කාර්යයක් වනු ඇත. එමෙන්ම ව්‍යාපෘතියෙන් ඔවුනට සැලසෙන ප්‍රයෝජනයන් පිළිබඳ පැතිරෙන මිත්‍යාමත හා වැරදි ආකල්ප වලට පිළිතුරු දීමටත් ඒවා වැලැක්වීමටත් හැකියාවක් පවතී.

ප්‍රජාතාන්ත්‍රවාදී රටක පැවතිය යුතු තීරණ ගැනීමේ විනිවිධ භාවයේ මූලධර්ම ආරක්ෂාවන ආකාරයට මහජන අදහස් විමසා බැලීමට ප්‍රමාණවත් කාලයක් ප්‍රජාව වෙනුවෙන් ලබාදිය යුතු වේ. මේ සඳහා ජනතාව දැනුවත් කර ඔවුන්ගේ අදහස් වලට ගැළපෙන පරිද්දෙන් සාදාරණ ගැටලු විසඳීමක් සිදුකළ යුතුය. නියමිත ව්‍යාපෘතියක ප්‍රධානතම අංගය වශයෙන් මහජන අදහස් විමසීම බව දැක්විය හැකිය.

**පාරිසරික බලපෑම් තක්සේරුව මගින් සැලසෙන ප්‍රතිලාභ**

තිරසාර සංවර්ධනය සඳහා ව්‍යාපෘති යෝජනාවේ හිතකර හා අහිතකර බලපෑම් පිළිබඳ අපක්ෂපාතීව විශ්ලේශණයක් ව්‍යාපෘතිය සැළසුම් කෙරෙන අවස්ථාවේදීම ලබා ගැනීමට හැකිවීම. එමනිසා එමගින් ප්‍රතිලාභ ලබන්නන්හට හා අනෙකුත් ප්‍රජාවට නිවැරදිව ව්‍යාපෘතිය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවීම.

අහිතකර බලපෑම් අවම කිරීමට හා හිතකර බලපෑම් උපරිම කිරීමට හැකිවීම. පාරිසරික වශයෙන් අහිතකර බාහිරතාවන් ඉවත් කිරීමට හෝ අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳවත්, හිතකර බාහිරතාවන් උපරිම කරගත හැකි මාර්ග පිළිබඳවත් නිවැරදි අවබෝධයක් ලබාදීමට ඇති හැකියාව.

අනවශ්‍ය වියදම් වැළකීමටත් අවශ්‍ය වියදම් අවම කර ගැනීමත් මගින් සම්පත් කාර්යක්ෂමව උපරිම වශයෙන් උපයෝජනය කර ගැනීමට ඇති හැකියාව. මෙමඟින් අර්ථක්‍රමයක් සතු සීමිත සම්පත් විකල්ප යෝජනා අතර බෙදාහැරීම හා තෝරාගැනීම පිළිබඳ පවත්නා ගැටලු වලට සාර්ථක විසඳුම් ලබාගත හැකිවීම.

ප්‍රමාදයකින් තොරව තිරසාර සංවර්ධන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යෑමට ඇති හැකියාව. මෙමඟින් සංවර්ධන ක්‍රියාවලියේ අපේක්ෂිත ඉලක්ක කරා ප්‍රමාදයකින් තොරව කඩිනමින් මෙන්ම නිවැරදිව ගමන් කිරීම හා ඒවායින් උපරිම ප්‍රතිඵල ලබාගත හැකිවීම.

ව්‍යාපෘතියට එරෙහිව එල්ල වන විරෝධතාවන් මෙන්ම කඩාකප්පල්කාරී ක්‍රියාවන් ඇතිවීමේ හැකියාව අවම වනවා සේම ඒවා වලක්වා ගැනීමට හැකිවීම. එනම් අදාළ ව්‍යාපෘතිය පිළිබඳ පවත්නා විනිවිධභාවය නිසා ඒ සඳහා පැවතිය හැකි අනවශ්‍ය බියවීම් දුරුකර ගත හැකිවීම.

යෝජිත ව්‍යාපෘතිය පිහිටුවන හෝ ක්‍රියාත්මක කෙරෙන ස්ථානයේ හෝ භූමියේ පාරිසරික ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත හැකිවීම. එමෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුකොට ගෙන පාරිසරික වශයෙන් සිදුවීමේ හැකියාව සහිත ප්‍රතිචාරයන් කල්තබා හඳුනා ගැනීමටත් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග කිසිදු කල් පමාවකින් තොරව ක්‍රියාවට නැගීමේ ඇති හැකියාව.

ප්‍රජාතන්ත්‍රවාදීව මහජනයා වෙත යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ සියලු සත්‍ය තොරතුරු යථාර්තවත්ව ලබාදීමට ඇති හැකියාව පහසු කරවීම. යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ සත්‍ය තොරතුරු විකෘති කරන්නන් හට ඒ සඳහා අවස්ථාවන් ලබා නොදීම හා අවශ්‍ය විටෙක ඊට පිළිතුරු ලබාදීම කළ හැකිවීම.

යෝජිත ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයට බලපාන නෛතික අවශ්‍යතාවන් පිළිබඳ තොරතුරු ලබාගත හැකිවීම. එනම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පිළිපැදිය යුතු නීතිමය තත්ත්වයන්ට යටත්වීමටත් නීතිමය වශයෙන් පරිසරය ආරක්ෂාකර ගැනීම සඳහා ප්‍රතිලාභ ලබන්නන් පමණක් නොව මහජනතාවද නිවැරිදිව දැනුවත්වීම.

යෝජිත ව්‍යාපෘතිය සඳහා වඩාත් යහපත් ප්‍රචාරණයක් හා පිළිගැනීමක් ලබාදිය හැකිවීම. එනම් මෙම ව්‍යාපෘතිය පිළිබඳ දේශීය හා විදේශීය වශයෙන් හොඳ ප්‍රචාරණයක් ලැබීම හේතු කොට ගෙන එහි ප්‍රතිලාභ වර්ධනය කරගැනීමටත්, මූල්‍යමය වශයෙන් පමණක් නොව සමාජීය වශයෙන් ද ප්‍රතිලාභ බෙදී යන්නන් සංඛ්‍යාත්මකව වැඩිකර ගැනීමටත්, ව්‍යාපෘතියේ ස්ථාවරත්වය පිළිබඳ පූර්ණ විශ්වාසයක් ගොඩ නැගීමට හැකිවීම.

තිරසාර සංවර්ධනය සඳහා මැනවින් දායකවීමට හැකිවීම. ආර්ථිකමය වශයෙන් ස්වභාවික පරිසරිය සතු සීමිත සම්පත් වර්තමාන පරිභෝජන ක්‍රියාවලියට පමණක් භාවිත නොකර අනාගත පරම්පරාවන්හි අවශ්‍යතා මැනවින් හඳුනාගෙන කටයුතු කිරීම. මෙමඟින් අනාගත පරම්පරා වෙත සම්පත් බෙදීයන පරිද්දෙන් ප්‍රතිලාභ විමධ්‍යගත කිරීමේ ඇති හැකියාව.

**සමාලෝචනය**

තිරසාර සංවර්ධනය හා බොදා වෙන්කළ නොහැකි වන පරිද්දෙන් පරිසර හිතකාමී ක්‍රියාවලීන් බැඳී පවතී. එහිදී ස්වභාවික පරිසරය ආරක්ෂාවන පරිද්දෙන් මානව අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගත යුතුය යන්න පොදුවේ පිළිගත යුත්තකි. යෝජිත සංවර්ධන ව්‍යාපෘති විශ්ලේෂණයේදී පරිසර බලපෑම් තක්සේරු කිරීම අනිවාර්ය ක්‍රියාවලියකි. අපිරිසිදු පරිසරයක ජීවත්වීමට වත්මන් මානවයා කිසි ලෙසකින්වත් සූදානම් නැත. එම නිසාම අපිරිසිදු පරිසරයක් නිර්මාණය නොකිරීමේ වගකීම අප සියලු දෙනාම සතු වන්නකි.

පරිසර බලපෑම් තක්සේරු ක්‍රියාවලිය මගින් ව්‍යාපෘති ආයෝජකයින්ට මෙන්ම එහි ප්‍රතිලාභ ලබන්නන්ටද එකී කටයුත්ත පිළිබඳ නිරවුල් අවබෝධයක් ලැබෙනු

ඇත. එමඟින් පරිසරය සුරක්ෂිත වනවා පමණක් නොව පාරිසරික වශයෙන් අහිතකර ප්‍රතිවිපාක ඉවත්කර ඒ වෙනුවට හිතකර පරිසරයක් නිර්මාණය කෙරෙනු ඇත.

තිරසාර සංවර්ධනයේ මූලික පදනමක් වන්නේ ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමයි. වර්තමාන ආයෝජකයින් විසින් පරිසරය සංරක්ෂණය කිරීමෙන් අනාගත ආයෝජකයින්ටද යහපත් පරිසරයක් උරුම කරදීමේ හැකියාව මෙමඟින් සිදුවනු ඇත. ගෝලීය වශයෙන් මානවයාගේ අනාගත සංවර්ධනය රඳා පවතිනුයේ වර්තමානයේදී කොතෙක් දුරට සාර්ථකව පරිසරය කළමනාකරණය කර ගනිමින් තම අවශ්‍යතා ඉටු කරගන්නේද යන්න මතය. එම නිසාම අනාගත සංවර්ධනය පිළිබඳ පුරෝකථනය කිරීමේ හැකියාව තීරණය කෙරෙන මුඛ්‍ය සාධකයක් වශයෙන් පාරිසරික බලපෑම් තක්සේරු හඳුන්වා දිය හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ

Andersson Lennart and Thomas Blom, (1998), “Sustainable and Development”, Motala Grafika AB, University of Karlstsd, Sweden.

Boadway W. Robin and Neil Bruce, (1984), “Welfare Economics”, Basil Blackwell Pub. Ltd., 108 Crowley Road, Oxford-OX4 1JF, England.

Dasgupta Partha, (2001), “Human Well-Being and the Natural Environment”, Oxford University Press, New York, United States.

Freeman A. Myrick, (1999), “The Measurement of Environmental and Resource Values”, RFF Press, 1616 P. Street, Washington DC.

Hanemann M. and B. Kanninen, (1996), “The Statistical Analysis of Direct-Response Data”, working paper, ARE, University of California, USA.

Layton D. and G. Brown, (2000), “Heterogeneous prefernces regarding global climate change”, Review of Economics and Statistics, USA.

Mackenzie J., (1993), “A Comparison of Contingent Preferences Models”, American Journal of Agricultural Economics, p. 593-603, USA.

Maler K. G., (1992), “Basic Welfare Economics and Valuation”, Scandinavian University Press, Oslo.

Mitchell R. Cameron, (2001), “An Experiment in Determing Willingness to Pay”, US Environmental Protection Agency, Washington DC.

Palmquist R., (2011), “Measuring Environmental Effect on Propert Values Without Hedonic Regressions”, Journal of Urban Economics, p. 333-347, USA.

Strarret A David, (2001), “Foundations of Public Economics”, Cambridge University Press, UK.

Sterner Thomas, (2013), “Policy Instruments for Environmental and Natural Resource Management”, RFF Press, 1616 p. Street, Washington DC.

Turnbull B. W., (2004), “Non-parametric Estimation of a Survivorship Function with Doubly Censored Data”, Journal of American Statistics Association, USA.

Dr. D.M.Ajith Dissanayaka
BA(Hons.), MA, PhD., Economics
Senior Lecturer,
Department of Economics,
University of Kelaniya.
Sri Lanka
ajith@kln.ac.lk